බෝපේ පෝද්දල ප්‍රාදේශීය සභාව
ගාල්ල දිස්ත්‍රික්කය

**1. මූල්‍ය ප්‍රකාශන**
----------------

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 ජුලි 07 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 01 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 22 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට බෝපේ පෝද්දල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
----------------------------------------

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම්**
---------------------------------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 ජනවාරි 19 දිනැති අංක PED/54 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ චක්‍රලේඛය අනුව 2011 ජනවාරි 01 දින සිට පළාත් පාලන ආයතන විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වුවත් එම ප්‍රමිති අනුගමනය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**
--------------------------

සභාව විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමග හෙළිදරව් කර නොතිබුණි.

**1.3.3 ගිණුම්කරණ අඩුපාඩු**
------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාමික පළාත් පාලන සේවකයින් වෙනුවෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක මුදල රු.3,363,994 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.3,281,033 ක් ලෙස දක්වා තිබීමෙන් ණයහිමියන් රු.82,961 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) වැටුප් ප්‍රතිපූර්ණය සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලද රු.12,463,545 ක මුදල සියළුම වැඩසටහන් අතර විභජනය නොකර, එක් වැඩසටහනක් යටතේ දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ප්‍රථම මාස 06 වෙනුවෙන් ගාල්ල රෙජිස්ටාර් ජනරාල් කාර්යාලයෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.9,194,576 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.6,000,000 ක් ලෙස දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම හා ණයගැතියන් රු.3,194,576 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සභාවට අයත් රු.50,000 ක් වූ ඉඩම් දෙකක්, වටිනාකම ගණනය නොකළ ඉඩම් දෙකක් සහ රු.75,000 ක් වූ අත් ට්‍රැක්ටර් 02 ක වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් ගිණුම් ශේෂය රු.54,175,566 ක් වුවද, ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීම් ගිණුමේ ශේෂය රු.54,112,790 ක් වූයෙන් රු.62,776 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර බිල්පත් ආයෝජන වටිනාකම රු.1,304,605 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.1,333,552 ක් ලෙස දක්වා තිබීමෙන් භාණ්ඩාගාර බිල්පත් ආයෝජන ශේෂය රු.28,947 ක් වැඩියෙන් දක්වා තිබුණි.

### 1.3.4 නොසැසඳූ පාලන ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගිණුම් විෂයයන් 08 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.2,601,256 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.23,043,830 ක් වූ වරිපනම් ශේෂයේ නිවැරදිභාවය වරිපනම් ලේඛන තුලනය නොකිරීම හේතුවෙන් පරීක්ෂා කිරීමට නොහැකි විය.

### 1.3.5 අවිනිශ්චිත ගිණුම්

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.559,464 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය හඳුනාගෙන ගිණුම් ගැලපීමට කටයුතු කර නොතිබුණි.

### 1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතුව රු.79,082,495 ක් වූ ගනුදෙනු සම්බන්ධව යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, උපලේඛන, සමීක්ෂණ මණ්ඩල වාර්තා, ශේෂ තහවුරු සහතික සහ ණය ලේඛනය විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.13,309,947 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.16,113,401 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 වරිපනම් බදු හා අක්කර බදු

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂවලට අදාලව සභාව විසින් අයකර ගත යුතුව තිබූ රු.23,043,830 ක් වූ වරිපනම් බදු සහ රු.11,114 ක් වූ අක්කර බදු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.2 වෙළඳ බලපත්‍ර ගාස්තු

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂවලට අදාලව සභාව විසින් අයකර ගත යුතුව තිබූ රු.32,466 ක් වූ වෙළඳ බලපත්‍ර ගාස්තු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට රු.832,060 ක උසාවි දඩ හා රු.23,244,122 ක් වූ මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

### 2.2.4 කඩ කාමර බදු දීම

පෝද්දල පොදු වෙළඳපොළ කඩ කාමර 08 පිළිබඳව 2014 ජනවාරි 24 දින සිදු කරන ලද ස්ථානීය පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2010 දෙසැම්බර් 27 දිනැති අංක 2010/01 දරන දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්වරයාගේ චක්‍රලේඛය ප්‍රකාරව කඩ බදු දීමේ දී සෑම ගිවිසුමක් ම වසර 03 කට වරක් යාවත්කාලීන කලයුතු බව දක්වා ඇතත්, පෝද්දල පොදු වෙළඳ පොල කඩ කාමර බදු ගිවිසුම් 1988 වර්ෂයෙන් පසුව අළුත් කර නොතිබුණි.

(ii) ගිවිසුමෙ කොන්දේසි ප්‍රකාරව මාසික බදු මුදල සෑම මසකම 15 වන දිනට පෙර ගෙවිය යුතු වුවද, සියලුම කඩ කාමරවලින් මාස 04 සිට 30 ක් දක්වා වූ කාල පරාසයක් තුල රු.424,081 ක බදුකුලී හා රු.46,697 ක දඩ මුදල් අයකරගත යුතුව තිබුණි.

(iii) ගිවිසුමේ කොන්දේසි අනුව බදු ගැණුම්කාර පක්ෂය විසින් මොනම හේතුවක් නිසාවත් බදු ගත් දේපල අතුරු බදු නොදිය යුතු වුවද කඩ කාමර 03 ක් අතුරු බදු දී තිබුණි.

(iv) ගිවිසුමේ කොන්දේසි අනුව බදුකරු විසින් මොනම හේතුවක් නිසාවත් සභාවේ පූර්ව අනුමැතියක් නොමැතිව බද්දට ගෙන ඇති කඩ කාමරයෙහි වෙනස්කම් නොකළ යුතු වුවද අංක 1, 3, 4, 5, 6, 7 සහ 8 යන කඩ කාමර සහ අංක 2 කඩ කාමරය වෙනස් කිරිම් කර තිබුණි.

(v) ගිවිසුමේ කොන්දේසි අනුව කඩ කාමරය තුළ පමණක් අලෙවි භාණ්ඩ වෙළඳාම් කිරීම සඳහා තබා ගත යුතු වුවත් සියලුම කඩ කාමර ඉදිරිපිට අලෙවි භාණ්ඩ වෙළඳාම සඳහා රැස්කර තිබුණි.

**2.2.5 දුරකථන විදුලි සංදේශ කුළුණු ගාස්තු**

-------------------------------------------

සභාව විසින් 2013 පෙබරවාරි 15 දින නිකුත් කරන ලද අංක 1798 දරන ගැසට් නිවේදනයේ පරිදි සම්ප්‍රේෂණ කුළුණක් පවත්වාගෙන යාම සඳහා වාර්ෂික වටිනාකම අනුව තීරණය කර ඇති බලපත්‍ර ගාස්තු අය කළයුතු වුවද, සභා බලප්‍රදේශය තුළ ඉදිකර තිබූ කුළුණු 03 ක් සඳහා රු.9,000 ක වාර්ෂික බලපත්‍ර ගාස්තු අයකර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

1988 අංක 74 දරන පනතින් සංශෝධිත 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ විධිවිධාන අනුව 2012 වර්ෂයේ දී උප සභාපතිවරයා හා මන්ත්‍රීවරුන් 05 දෙනෙකු විසින් ද, 2013 වර්ෂයේ දී මන්ත්‍රීවරුන් 08 දෙනෙකු විසින් ද, වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------------

3.2.1 **ගීකියනගේවත්ත ඕවිට ඉඩම් වෙන්දේසිය**

----------------------------------------------

පිඹුරු අංක : 483/2011 මගින් අක්කර 03 යි පර්චස් 38.94 ක් වූ නාවින්න ගීකියනගේවත්ත ඕවිට ඉඩම කැබලි කිරීම සඳහා පුද්ගලික සමාගමකට 2013 අගෝස්තු 05 දින කැබලි සැලැස්ම අනුමත කර සංවර්ධන බලපත්‍රය ලබා දී තිබුණි.

වෙන්දේසි කරනු ලැබූ ඉඩම් වලින් සභාවට ලබා දී තිබූ ඉඩම් කැබලි 02 පිළිබඳව 2014 ජනවාරි 28 දින සිදුකළ ස්ථානීය පරීක්ෂාවේ දී පර්චස් 10.83 ක් වූ කැබලි අංක 01 දරණ ඉඩම, ඉඩමට ප්‍රවේශ වන ස්ථානයේ පවතින තීරු බිම් කොටසක් බවත් පර්චස් 26.13 ක් වූ කැබලි අංක 28 දරණ ඉඩම නිරිතදිග කොනේම පවතින වාරි ඇලේ ජලය රැස්වන ස්ථානයට මායිම්ව පිහිටි ඉඩම් කැබැල්ලක් බවත් නිරීක්ෂණය විය.

**3.2.2 අගරු චෙක්පත්**

------------------

2011 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පැවතුණ රු.20,339 ක් වූ අගරු චෙක්පත් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

**3.3 නිෂ්ක්‍රීය වත්කම්**

---------------------

2013 ජුනි 05 දිනැති අංක : PCMD/PR/2013 දරන ජනාධිපති ලේකම්වරයාගේ චක්‍රලේඛය පරිදි රජයේ ආයතන තුළ ප්‍රයෝජනයට නොගෙන විනාශ වෙමින් පවතින පැරණි වාහන හා යන්ත්‍රෝපකරණ ඉදිරි මාස 03 ක කාලයක් තුළ අපහරණය කිරීමට වැඩපිළිවෙලක් සකස් කරන ලෙසට දන්වා තිබුණි. සභාවට අයත් අත් ට්‍රැක්ටර් 02 ක් හා බවුසරයක් වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට දිරාපත් වෙමින් පවතින බව 2014 ජනවාරි 24 දින සිදුකරන ලද විගණන පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය. මෙම භාණ්ඩ සම්බන්ධයෙන් ඉහත චක්‍රලේඛය පරිදි කටයුතු කර වාර්තා කරන ලෙස 2013 සැප්තැම්බර් 17 දින පළාත් පාලන කොමසාරිස් විසින් සභාපතිවරයාට දන්වා තිබුණ ද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**4.** **පද්ධති හා පාලන**

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය